# දළ දේශීය නිෂ්පාදිතය

## 2024 වසරේ දෙවන කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය

පදනම් වර්ෂය 2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 වසරේ දෙවන කාර්තුව (( අප්‍රේල් 1 සිට ජුනි 30 දක්වා)) සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් (2015) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත.

ඒ අනුව 2024 වසරේ දෙවන කාර්තුවේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 6,742,504ක් සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,768,293ක් ලෙස වාර්තා වේ. 2023 වසරේ දෙවන කාර්තුව සඳහා මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 6,082,626ක් සහ රුපියල් මිලියන 2,644,240ක් වශයෙන් වාර්තා වී තිබුණි.

- 2024 වසරේ දෙවන කාර්තුවේදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 4.7 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වසරේ දෙවන කාර්තුවේදී මෙම වර්ධනය සටහන් වුයේ සියයට 3.0 ක ඍණ වර්ධනයක් වශයෙනි.
- 2024 වසරේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 1.7ක හා කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 10.9ක් සහ සියයට 2.5ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත.
- 2024 වසරේ දෙවන කාර්තුවේදළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු, සේවා ආර්ථික කටයුතු සහ භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු පිළිවෙලින් සියයට 10.0ක්, සියයට 25.5 ක්, සියයට 55.4ක් සහ සියයට 9.1ක් වශයෙන් දායකත්වය ලබා දී ඇත.

**අන්තර්ගතය**

2024 දෙවන කාර්තුවේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 2
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 4
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 6
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 9

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## 1.0 2024 වසරේ දෙවන කාර්තුව සඳහා සමස්ත ආර්ථිකයේ හැසිරීම

2024 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කර ඇති බවයි. ඒ අනුව, 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,644,240 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 2,768,293 ක් දක්වා ඉහළ ගොස් ඇත.

රූපසටහන 01
**ප්‍රධාන ආර්ථික කටයුතුවල වර්ධනය -2023 සහ 2024 දෙවන කාර්තුව**




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 6,082,626 ක් ලෙස වාර්තා වූ අතර එය 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 6,742,504 ක් දක්වා සියයට 10.8 කින් වැඩි වී ඇත.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 10.0 ක්, සියයට 25.5 ක්, සියයට 55.4 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 9.1 ක් ලෙස වාර්තා වේ.

2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු හා සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 1.7, සියයට 10.9 ක් සහ සියයට 2.5 ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත. ඊට අමතරව භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2024 දෙවන කාර්තුවේදී සියයට 2.8 කින් වර්ධනය විය.

2024 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය, පෙර වසරේ (2023) දෙවන කාර්තුවේ වාර්තා වූ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අගයට සාපේක්ෂව ගණනය කෙරේ.

2024 දෙවන කාර්තුව තුළ ශ්‍රී ලංකා ආර්ථිකය පෙර වසරේ එම කාර්තුවට සාපේක්ෂව අඩු උද්ධමනයක් පැවතුණි. මේ අතර, 2023 දෙවන කාර්තුවට සාපේක්ෂව පොලී අනුපාත පහත වැටීම, අඩු විනිමය අනුපාත සහ ආනයන සීමා ලිහිල් කිරීම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව වැඩි වීමට ඉවහල් වී ඇත. මෙම හිතකර ආර්ථික තත්වයන් සහ ඉහළ ගිය සංචාරක පැමිණීම් සමස්තයක් වශයෙන් අඛණ්ඩව කාර්තු හතරක දී දළ දේශීය නිෂ්පාදිතයේ වාර්තාවී ඇති වර්ධනය සඳහා හේතුවී ඇත. මීට අමතරව, 2024 දෙවන කාර්තුවේ දී පැවති අධික වර්ෂාපතනය වී, තේ සහ රබර් වැනි සමහර

වගාවන්ට අහිතකර ලෙස බලපා ඇත. කෙසේ වෙතත්, මෙම දේශගුණික තත්වය ජල විදුලිබල උත්පාදනය හරහා එකතු කළ අගය වැඩි කිරීමට වාසිදායක තත්වයක් ඇතිකර ඇත.

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 4.2 ක වර්ධනයක් වාර්තා කර තිබූ කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ද සමස්තයක් වශයෙන් සියයට 1.7 ක වර්ධනයක් වාර්තා කර ඇත.

කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වාර්තා වී ඇති මෙම වර්ධනය සඳහා 'ධාන්‍ය වගා කිරීම' (සියයට 22.7), ‘සත්ව නිෂ්පාදනය’ (සියයට 8.6), ‘කරදිය ධීවර කටයුතු’ (සියයට 7.7), 'පළතුරු වගා කිරීම' (සියයට 3.9) 'එළවළු වගා කිරීම' (සියයට 3.8), ‘මිරිදිය ධිවර කටයුතු (සියයට 3.6), 'කුළු බඩු වගා කිරීම' (සියයට 3.0), ‘පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව’ (සියයට 1.4), ‘වන වගා සහ දැව කදන් නිෂ්පාදනය’ (සියයට 0.7) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කරමින් දායකවී ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුවේ දී, 'පැළ බෝකිරීම' (සියයට 23.7), 'රබර් වගා කිරීම' (සියයට 18.7), 'තේ වගා කිරීම' (සියයට 8.8), 'අනෙකුත් ස්ථිර බෝග වගා කිරීම' (සියයට 4.1), 'කෝපි, කොකෝවා වගා කිරීම' (සියයට 4.0), 'කෘෂිකාර්මික සහාය සේවා කටයුතු (සියයට 3.7), ‘උක්, දුම්කොළ හා අනෙකුත් ස්ථිර නොවන බෝග වගා කිරීම’ (සියයට 2.4), ‘වී වගා කිරීම' (සියයට 1.2) වශයෙන් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 11.7 ක පසුබැසීමක් වාර්තා කර තිබූ සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ද සියයට 10.9 ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී 'ඉදිකිරීම් කර්මාන්තය' සහ 'පතල් හා කැනීම් කර්මාන්තය' පිළිවෙලින් සියයට 15.5 ක් සහ සියයට 21.5 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව ද නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 7.0 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර එහිදී ‘මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 31.6), ‘රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය’ (සියයට 24.0), ‘දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන’(සියයට 21.1), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 8.0), ‘රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 7.0), 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 6.8), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 6.6), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 5.5), ‘ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය’(සියයට 5.0), වෙනත් නිමැවුම් කර්මාන්ත’(සියයට 3.7) ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත.

මේ අතර 2024 දෙවන කාර්තුව තුළ නිමවුම් කර්මාන්ත ආර්ථික කටයුතු අතුරින් 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' සහ ‘යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය’ පමණක් පිළිවෙළින් සියයට 13.4 සහ සියයට 2.5 ක පසුබැසීම් වාර්තා කර ඇත.

එසේම 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කර්මාන්ත අංශයේ ආර්ථික කටයුතු අතුරෙන් ‘විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම’ සහ ‘ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම’ පිළිවෙලින් සියයට 21.9 ක් සහ සියයට 4.3 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 0.5 ක පසුබැසීමක් වාර්තා කර තිබූ සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 2.5 ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී ‘නවාතැන් හා ආහාර පාන සැපයීම’ (සියයට 21.1), 'රක්ෂණ සේවා' (සියයට 14.1), 'තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ කටයුතු' (සියයට 14.0), 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 13.3), 'විදුලි සංදේශ සේවා' (සියයට 6.7), 'මූල්‍ය සේවා' (සියයට 5.7), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනි විකාශන කාර්යයන්' (සියයට 5.3), 'දේපොළ වෙළඳාම් කටයුතු සහ නිවාස අයිතිය' (සියයට 4.2), 'අධ්‍යාපනය' (සියයට 2.4), 'වෘත්තීය සේවා' (සියයට 2.3), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 1.8), 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 0.8) සහ'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 0.6) ක් වශයෙන් මෙම කාර්තුවේ දී ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

මේ අතර සේවා ආර්ථික කටයුතු අතුරෙන් 'රාජ්‍ය පරිපාලනය' සියයට 3.1 ක් සහ 'සෞඛ්‍ය සේවා' සියයට 2.3 ක් වශයෙන් ඍණ වර්ධන වේගයන් 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2023 වසරේ දෙවන කාර්තුවේ දී 230.0ක් (2015=100) ලෙස වාර්තා වන අතර 2024 වසරේ දෙවන කාර්තුවේ දී 243.6ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2024 වසරේ දෙවන කාර්තුවේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 5.9කි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය ( NCPI ) (2021=100) 2023 වසරේ දෙවන  කාර්තුවේ දී 203.0ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2024 වසරේ දෙවන  කාර්තුවේ දී 207.5ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2023 වසරේ සිට 2024 වර්ෂය දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 2.2කි.

## 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

2024 වසරේ දෙවන  කාර්තුවේ දී සමස්තයක් ලෙස කෘෂිකාර්මික ආර්ථික කටයුතු, 2023 වසරේ දෙවන  කාර්තුව හා සසඳන විට සියයට 1.7 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 674,374ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 236,539 ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2024 වසරේ දෙවන  කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 10.0ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 02
**කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය -  2024 දෙවන කාර්තුව**




**මූලාශ්‍රය:**
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ධාන්‍ය  වර්ග වගා කිරීම (සහල් හැර)' යන උප ක්‍රියාකාරකම 2024 දෙවන කාර්තුව සඳහා සියයට 22.7 ක ධනාත්මක වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර එය 2023 වසරේ එම කාර්තුවේ වාර්තා වූ සෘණ වර්ධන වේගයේ සියයට 1.9 ට සාපේක්ෂව වේ. 'උඳු', 'මුං', 'බඩඉරිඟු', සහ 'රට කජු' යන ප්‍රධාන භෝග කිහිපයක නිෂ්පාදනය මෙම කාර්තුව තුළ පිළිවෙළින් සියයට 80.4 කින්, සියයට 53.8 කින්, සියයට 52.0 කින්, සියයට 34.3 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, සමහර නිෂ්පාදන සහ සමහර නිෂ්පාදනවල නිෂ්පාදකයින්ගේ මිල ගණන් පෙර වසරේ එම කාර්තුව හා සසඳන විට පහත වැටීමක් පෙන්නුම් කර ඇත.

"වී වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2023 වසරේ දෙවන කාර්තුව සමඟ සැසඳීමේ දී 2024 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 1.2 ක පසුබැස්මක් වාර්තා කර ඇති අතර දළ දේශීය නිෂ්පාදනය සඳහා එකතු කළ අගය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 29,060 ක් ලෙස වාර්තාවේ.

"එළවළු වගාකිරීම "ආර්ථික කටයුත්ත 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 3.8ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. මේ සඳහා 2024 යල කන්නයේ අපේක්ෂිත අස්වැන්නේ සියයට 6.6 ක ඉහළ යෑම හේතු වී ඇත. කෙසේ වෙතත් 2024/2023 මහ කන්නයේ අපේක්ෂිත අස්වැන්න සියයට 4.6 ක පහළ වැටීමක් වාර්තා කර ඇත. තවද, මෙම කාර්තුවේදී එළවළු නිෂ්පාදකයන්ගේ මිල දර්ශකයේ සියයට 3.2 ඉහළ යාමක් හඳුනාගෙන ඇත. මෙම කාර්තුවේ දළ එකතු කළ අගය තුළ මයියොක්කා, කැරට්, ගෝවා, බටු, බෝංචි සහ තක්කාලි යන එළවළු වර්ග වැඩි දායකත්වයක් සපයනු ලැබී ය.

"තෙල් සහිත පලතුරු වගාව" යන ආර්ථික ක්රියාකාරකම ප්‍රධාන වශයෙන් පොල් වගාව, තැඹිලි වගාව හා කටුපොල් වගාව යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වන අතර පොල් වගා කිරීම ඉන් ප්‍රධාන වේ. "තෙල් සහිත පලතුරු වගාව" යන උප ආර්ථික ක්‍රියාකාරකම 2024 වසරේ දෙවන කාර්තුව තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 26,970 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 0.8ක දායකත්වයක් ලබාදී ඇත. 2023 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී පොල් ගෙඩි නිෂ්පාදනය සියයට 1.8කින් පමණ ඉහල ගොස් ඇත. නමුත් 2023 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ පොල් ගෙඩි අපනයනය සියයට 47කින් පමණ සැලකියයුතු ලෙස වැඩි වී ඇති අතර තැඹිලි අපනයනය සියයට 37 කින් අඩු වී ඇත. 2024 වසරේ දෙවන කාර්තුවේදී "තෙල් සහිත පළතුරු වගා කිරීම" යන සමස්ත ආර්ථික කටයුත්ත සියයට 1.4ක වර්ධනයක් වාර්තා කර ඇත.

"තේ වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2024 දෙවන කාර්තුවේ දී සියයට 8.8 ක පසුබැස්මක් වාර්තා කර ඇති අතර 2023 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 3.7 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2024 වසරේ දෙවන කාර්තුවේ දී "නිම් තේ" නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 8.0 ක පසුබැස්මක් වාර්තා කර ඇත. කොළඹ වෙළඳපොළෙහි නිම් තේ කිලෝවක සාමාන්‍ය මිළ, පසුගිය වසරේ මෙම කාර්තුව හා සැසඳීමේ දී රු. 1,060.98 සිට රු. 1,243.54 දක්වා සියයට 17.2 ක වර්ධනයක් වාර්තාවී ඇත. තේ නිෂ්පාදනය සඳහා සියයට 59.8 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහතරට තේ නිෂ්පාදනය සියයට 2.5 ක පසුබැස්මක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

"රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතුකළ අගය සියයට 18.7 ක පසුබැස්මක් ද රබර් නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 21.1 ක පසුබැස්මක් ද 2024 වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත. 2023 වසරේ දෙවන කාර්තුවේ දී "රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතුකළ අගය සියයට 5.9 ක හා රබර් නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 5.2 ක වර්ධනයක් වාර්තාවී ඇත. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 වසරේ දෙවන කාර්තුවේ තොරතුරු වලට අනුව, සකස් කළ රබර් කිලෝග්රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් ප්‍රමාණයෙහි සාමාන්‍ය මිළ රු. 573.24 සිට රු. 713.23 දක්වා සියයට 24.4 ක වර්ධනයක් වාර්තාවී ඇත.

"අනෙකුත් ස්ථිර බෝග වගා කිරීම" උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. 2023 වසරේ දෙවෙනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ සමස්ත ආර්ථික කටයුත්ත ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 7,813 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 4.1ක පසුබෑමක් වාර්තා කර ඇත.

'සත්ත්ව නිෂ්පාදනය'යන ආර්ථික කටයුත්ත කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය හා මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම 2024 වසරේ දෙවනවන කාර්තුවේ දී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 23,400 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 1.6 ක දායකත්වයක් ලබාදී ඇත. මෙම කාර්තුව තුළ දී සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2023 වසරේ දෙවනවන කාර්තුවට සාපේක්ෂව සියයට 8.6 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්වේ දත්ත වලට අනුව මෙම කාර්තුව තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම සියයට 12.8 ක, මස් පිණිස ඌරන් ඇති කිරීම සියයට 10.2 ක හා බිත්තර නිෂ්පාදනය සියයට 17.2 කින් වැඩි වී ඇත. එමෙන්ම 2023 වසරේ දෙවනවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළදී බිත්තර සඳහා මිල යන නිෂ්පාදකයාගේ මිල හැර අනෙකුත් සත්ත්ව නිෂ්පාදන වල නිෂ්පාදකයාගේ මිල ගණන් ඉහළ ගොස් ඇත.

"පැළ හා බීජ ප්‍රවර්ධනය" යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ රට තුළ පොල්, තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, මල් හා පලතුරු යන පැළ වර්ග නිෂ්පාදනය කිරීමයි. 2023 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම වසරේ දෙවන කාර්තුව තුළදී ස්ථාවර (2015) මිල ගණන් යටතේ රුපියල් මිලියන 204 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 23.7 ක සැලකිය යුතු පසුබෑමක් වාර්තා කර ඇත.

කෘෂි සහායක කාර්යයන් යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා වී වගාවේදී, කුඹුරු බිම් සකස් කිරීමේදී හා අස්වනු නෙලීමේදී පිලිවෙලින් රෝද හතරේ හා රෝද දෙකේ ට්‍රැක්ටර් මෙන්ම ඒකාබද්ධ අස්වනු නෙලීමේ යන්ත්‍ර (Combined Harvestor) යොදා ගනු ලබයි. එම සේවය ලබා දීම තුලින් ආර්ථිකයට ජනනය වන වටිනාකම මෙහිදී සලකනු ලබයි. එය මෙම ආර්ථික

කටයුත්තෙහි ප්‍රධාන සංරචකයි. ඊට අමතරව ධාන්‍ය වගා භෝග කිහිපයක් හා උඩරට එලවළු භෝග කිහිපයක් සඳහා එලෙස පස සකස් කිරීමට යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේ පිරිවැය ඔස්සේ ඒ සඳහා වන යාන්ත්‍රික සහායක සේවා සැපයුම මීට එකතු කරනු ලබයි. එම භෝග සඳහා වන යාන්ත්‍රික යෙදවුම් අදාළ වෙන්නේ දෙවෙනි හා සිවු වන කාර්තු වලදී ය. 2024 වසරේ යල කන්නය සඳහා ඇස්තමේන්තු ගත, අපේක්ෂිත බිම් ප්‍රමාණයන් අනුව, වී වගා බිම් ප්‍රමාණය පහළ යාම පුරෝකතනය කොට ඇති අතර ඒ අනුව එම බිම් ප්‍රමාණය තුල කෘෂි යන්ත්‍රෝපකරණ යෙදවුම් හි පහළ යාමේ බලපෑම, 2024 වසරේ දෙවන කාර්තුවේ ඇස්තමේන්තුව තුල පෙන්නුම් කරයි. මෙම පහළ යාම කෘෂි සහායක කාර්‍යයන්හි 3.7 ක ඍණ වර්ධනය කෙරෙහි හේතු විය.

"වන සම්පත් හා දැව කඳන් නිෂ්පාදනය" යන උප කෘෂිකාර්මික ආර්ථික කටයුත්ත තුල ප්‍රධාන දායකත්වය නියෝජනය වන්නේ දර නිෂ්පාදනය හා දැව කඳන් නිෂ්පාදනය තුලින් ජනනය වන වටිනාකමයි. දර නිෂ්පාදනය තුලින් ආර්ථිකයට එකතු වන අගය ඇස්තමේන්තු කරනු ලබන්නේ, දර පරිභෝජන අවශ්‍යතාව ඇස්තමේන්තු කිරීම ඔස්සේය. දර පරිභෝජන අවශ්‍යතාවය ගෘහස්ථ, කර්මාන්ත සහ වෙනත් වශයෙන් වෙන් වෙන්ව ඇස්තමේන්තු කරනු ලබයි. රටේ පැවති ගෘහස්ථ ගෑස් අවශ්‍යතාව පසුගිය වසරට සාපේක්ෂව ක්‍රමයෙන් සාක්ෂාත් කරගැනීමත් මිළ මට්ටමේ අඩුවීමත් නිසා, පසුගිය අවුරුද්දේ සිවුවෙනි කාර්තුවේ සිට ගෘහස්ථ දර ඉල්ලුම ක්‍රම ක්‍රමයෙන් පහළ යාමක් පෙන්නුම් කරයි. මෙම ඉල්ලුම අඩු වීම නිසා, දර නිමැවුම තුලින් ආර්ථිකයට ලැබෙන දායකත්වය, ක්‍රමයෙන් අඩුවී ඇත. එමෙන්ම, පසුගිය වසරේ දෙවන කාර්තුවේ මිළට සාපේක්ෂව මෙම කාර්තුවේ දර වල මිළ නොවෙනස්ව පවතින අතර, රාජ්‍ය දැව සංස්ථාවේ දැව කඳන් නිෂ්පාදනය ද සියයට 1.3 කින් පමණ ඉහළ යාමක් මේ කාර්තුවේ දී වාර්තා කොට ඇත. ඒ අනුව, ස්ථාවර මිළ ගනන් අනුව මෙම ආර්ථික කටයුත්ත මෙම කාර්තුව තුල සියයට 0.7 ක ධන වර්ධනයක් පෙන්නුම් කරයි.

2023 දෙවන කාර්තුවේදී කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්තෙහි වර්තමාන මිළ අනුව එකතුකළ වටිනාකම රුපියල් මිලියන 70892 ක් වන අතර එය දළ දේශීය නිෂ්පාදිතය තුළ සියයට 1.1 ක දායකත්වයක් දරයි.මෙම ආර්ථික කටයුත්ත ස්ථාවර මිළ අනුව ගණනය කලවිට 2023 දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 දෙවන කාර්තුවේදී සියයට 7.7ක වර්ධනයක් දක්නට ලැබේ. ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තා වලට අනුව පසුගිය වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 දෙවන කාර්තුවේදී වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය සියයට 1.5 ක පසුබෑසීමක් හා ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 20.0 ක වර්ධනයක් වාර්තා වන අතර සමස්ත කරදිය මත්ස්‍ය නිෂ්පාදනය 2024 දෙවන කාර්තුවේදී සියයට 7.8 ක වර්ධනයක් දක්නට ලැබේ.

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවි වගාව ආර්ථික කටයුත්ත එකතුකළ වටිනාකම 2023 දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 දෙවන කාර්තුවේදී සියයට 3.6 ක ඉහල යමක් වාර්තා වේ.

## 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

2023 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 වසරේ දෙවන කාර්තුවේ දී සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 10.9ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 1,717,691 ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 777,045 ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2024 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 25.5ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 03
**කාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2024 දෙවන කාර්තුව**




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2024 වර්ෂයේ දෙවන කාර්තුවේදී “පතල් හා කැනීම්” කර්මාන්තය පවත්නා මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.6 ක දායකත්වයක් දක්වා ඇති අතර පසුගිය වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 21.5 ක වර්ධනයක් වාර්තා කර ඇත. පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්, මැණික් කැනීම් හා අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම් වශයෙන් කාණ්ඩ තුනකින් සමන්විත වේ. සමස්ත පතල් හා කැනීම් ආර්ථික කටයුත්තේ දළ එකතුකළ වටිනාකමෙන් සියයට 90.5ක පමණ ප්‍රමාණයක් ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් මගින් ලබා දෙන අතර එය 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 20.6 ක ඉහළ යාමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම් සියයට 0.42 ක ඉහළ යාමක් සහ මැණික් කැනීම් සියයට 0.03 ක පසුබැසීමක් වාර්තා වන නමුත් වැඩිම දායකත්වයක් දක්වන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැණීම්වල ඉහල වර්ධනය හේතුවෙන් මෙම ආර්ථික කටයුත්තේ සමස්තයක් වශයෙන් 2023 දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 21.5 ක වර්ධනයක් 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා වී ඇත.

“විදුලිය, ගෑස්, උණුසුම් වායු සැකසුම් සැපයුම” උප ආර්ථික කටයුත්ත සම්බන්ධයෙන් ගත්කළ සමස්ත විදුලිය ජනනය 2023 දෙවන කාර්තුවේ දී වාර්තා වූ ගිගාවෝට් පැය 3,943 සිට 2024 දෙවන කාර්තුවේ දී ගිගාවෝට් පැය 4,315 දක්වා සියයට 9.4 කින් වැඩි වී ඇත. මෙම වැඩිවීම තුළ විශේෂයෙන් ජල විදුලි ජනනය සහ පුනර්ජනනීය විදුලිය ජනනය පිළිවෙලින් සියයට 53.2 ක් සහ සියයට 39.1 ක් වශයෙන් සැලකිය යුතු ලෙස වැඩිවී ඇත. තව ද එහිදි අතරමැදි යෙදවුම් සඳහා සාමාන්‍යයෙන් විශාල පිරිවැයක් වැයවෙන තාප හා ගල් අඟුරු විදුලි ජනනය සියයට 14.5 කින් අඩුවී ඇත. 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ලංකා විදුලි බල මණ්ඩලයේ නිමැවුමේ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ සියයට 14.0 ක වැඩිවීමක් වාර්තා කර ඇති අතර එහිදි අතරමැදි පරිභෝජන වියදම් සියයට 8.0 ක වැඩිවීමක් වාර්තා කර ඇත. ඒ අනුව එහි දළ එකතුකළ අගය සියයට 23.0ක පමණ වැඩිවීමක් වාර්තා කර ඇත. එහිදි ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කෙරෙන විදුලිය නිමැවුම් වටිනාකම සියයට 22.0 ක වැඩිවීමක් වාර්තා කර ඇති අතර ඒ අනුව 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී පැවති මිල ගණන්වලට සාපේක්ෂව 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී විදුලිය ගාස්තු පහළ වැටීම එමගින් පෙන්නුම් කෙරේ. තව ද 2024 දෙවන කාර්තුවේ දි ජල විදුලිය නිෂ්පාදනය හා පුනර්ජනනීය විදුලිය නිෂ්පාදනය තුළින් ලබාදුන් ඉහළ දායකත්වය යටතේ ජල විදුලිය:තාප විදුලිය:පුනර්ජනනීය විදුලිය අනුපාතය 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දි 29:47:24 ක් ලෙස වාර්තා වී ඇත. මෙම අනුපාතය 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 21:61:19 ක් ලෙස වාර්තා වී පැවතිණි.

ජල එකතු කිරීම, පිරිපහදු කිරීම සහ සැපයුම් ක්‍රියාකාරකම් හී මුළු නිමැවුම 2024 දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ සියයට 14.3ක වැඩිවීමක් වාර්තා කර ඇති අතර කෙසේවෙතත් අතරමැදි පරිභෝජනය සඳහා වූ වියදම සියයට 31 ක අඩු වීමක් වාර්තා කර ඇත. එබැවින් වත්මන් මිල ගණන් අනුව මෙහි දළ එකතුකළ අගය සියයට 82.5 ක වැඩිවීමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, 2024 දෙවන කාර්තුවේදී නිෂ්පාදකයින්ගේ මිල දර්ශකයේ (PPI) විදුලි උප දර්ශකය සියයට 30.1 කින් අඩු වීමක් සහ ජල උප දර්ශකය සියයට 11.4 ක වැඩිවීමක් වාර්තා කර ඇත. එබැවින් ස්ථාවර මිල ගණන් යටතේ මෙහි දළ එකතුකළ අගය සියයට 4.3 ක වර්ධනයක් වාර්තා කර ඇත. මීට අමතරව, මලාපවහන, අපද්‍රව්‍ය පිරිපහදු කිරීම සහ බැහැර කිරීමේ කටයුතු 2024 දෙවන කාර්තුවේදී සියයට 1.9 ක වර්ධනයක් වාර්තා කර ඇත.

2023 දෙවන කාර්තුව හා සසඳන විට 2024 දෙවන කාර්තුවේදී 'ඉදිකිරීම්' ක්‍රියාකාරකම් සියයට 15.5 කින් වර්ධනය වී ඇත. මෙම කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ඉදිකිරීම් කටයුතුවල දායකත්වය සියයට 5.7 ක් ලෙස වාර්තා වී ඇත. එමෙන්ම 2024 දෙවන කාර්තුව තුළ සමස්ත සිමෙන්ති සැපයුම සියයට 16.67 කින් ඉහල ගොස් ඇති අතර සිමෙන්ති ඇතුළු බොහෝ ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල පහළ යාම මෙම ධන වර්ධනයට හේතු වී තිබේ.

### 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

සමස්ත නිෂ්පාදන කර්මාන්ත ක්‍රියාකාරකම් 2023 දෙවන කාර්තුවේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 422,820 සිට 2024 දෙවන කාර්තුවේදි රුපියල් මිලියන 452,253 ක් දක්වා දායක වී ඇත. 2023 දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 දෙවන කාර්තුවේ දී සියයට 7.0 ක සැලකිය යුතු වර්ධන වේගයක් පෙන්නුම් කරයි. බොහෝ නිෂ්පාදන ක්‍රියාකාරකම් මෙම කාර්තුව තුළ සැලකිය යුතු වර්ධන වේගයක් වාර්තා කර ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 6.4ක දායකත්වයක් ලබා දෙන'ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය' යන උප ක්‍රියාකාරකම් 2023 දෙවන කාර්තුවේ දී සියයට 3.3 ක වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර එය තව දුරටත් 2024 දෙවන කාර්තුවේ දී සියයට 5.0 ක වර්ධන වේගයක් වාර්තා ඇත.

රෙදිපිළි නිෂ්පාදනය, ඇඟලුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය' යන උප ක්‍රියාකාරකම් '2023, දෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 19.0 ක සෘණ වර්ධන වේගයට සාපේක්ෂව 2024 දෙවන කාර්තුවේ දී සියයට 6.6 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත.

'කෝක් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන' 2023 දෙවන කාර්තුවේ සියයට 473.7 ක කැපී පෙනෙන වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර 2024 වසරේ එම කාර්තුවේ දී සියයට 13.4 ක සංකෝචනයක් වාර්තා වී ඇත. මෙම කාර්තුවේ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණය සියයට 13.3 කින් පහළ ගොස් ඇත.

2023 දෙවන කාර්තුවේ දී සියයට 3.9 ක වර්ධනයක් වාර්තා වූ 'රසායනික නිෂ්පාදන සහ මූලික ඖෂධ නිෂ්පාදන කර්මාන්තය තව දුරටත් 2024 වසරේ එම කාර්තුවේ දී සියයට 24.0 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වේ.

'රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, සම් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය 2023 දෙවන කාර්තුවේ දී සියයට 27.3 ක පහත වැටීමක් වාර්තා කර ඇති අතර, 2024 දෙවන කාර්තුවේ සියයට 7.0 ක වර්ධනයක් වාර්තා වේ.

තවද, 'මූලික ලෝහ සහ ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදන කර්මාන්තය ' (සියයට 31.6), සහ 'වෙනත් නිෂ්පාදන හා අළුත්වැඩියා ' (සියයට 3.7), 'ගෘහ භාණ්ඩ හැර දැව නිෂ්පාදනය සහ දැව කෝක් නිෂ්පාදනය' (සියයට 21.1), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය (සියයට 21.1), ක වර්ධන අනුපාතයන් වාර්තා වේ.

## 1.3 සේවා ආර්ථික කටයුතු

2024 වසරේ දෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 2.5ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,737,711ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 1,580,913 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2024 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 55.4ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 04
සේවා ආර්ථික කටයුතුවල වර්ධනය - 2024 දෙවන කාර්තුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

“තොග සහ සිල්ලර වෙළඳාම” 2024 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 12.9ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2023 වසරේ දෙවන කාර්තුවේ වාර්තාවූ සියයට 0.1ක සෘණ වර්ධනය හා සැසඳීමේදී 2024 දෙවන කාර්තුවේදී සියයට 0.8ක ධන වර්ධනයක් පෙන්නුම් කර ඇත.

“තොග හා සිල්ලර වෙළඳාම” යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාමට අමතරව ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, විද්‍යුත් උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ වෙළෙඳාම යනාදිය ආවරණය කරයි.

භාණ්ඩ ආනයන සහ තොග හා සිල්ලර වෙළෙන්දුන් හරහා පාරිභෝගිකයන් අතට පත්වන දේශීය භාණ්ඩ නිෂ්පාදිතයේ උච්චාවචනයන් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2023 වසරේ දෙවන කාර්තුව සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 1,327,257 වූ අතර 2024 වසරේ දෙවන කාර්තුව සඳහා එය රු. මිලියන 1,290,193 දක්වා සියයට 2.8කින් අඩුවී ඇත. එසේම, මෙම කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2023 වසරේ දෙවන කාර්තුවේ පැවති රු. මිලියන 250,933 සිට රු. මිලියන 220,418 දක්වා සියයට 12.2කින් අඩුවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2023 දෙවන කාර්තුව හා සසඳන විට 2024 වසරේ දෙවන කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 8.9කින් අඩුවී ඇති අතර සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 7.3කින් වැඩිවී තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2023 වසරේ දෙවන කාර්තුව හා සසඳන විට 2024 වසරේ දෙවන කාර්තුවේදී ලෝකයේ සෙසු රටවල් වෙත යොමු වූ මුළු අපනයන වටිනාකම සියයට 0.1කින් ධනව වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 7.5කින් වැඩිවී තිබේ. එහිදී මෙම කාර්තුවේදී කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 1.6කින් ද කාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 8.4කින් ද වැඩිවී ඇත.

“මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම” යන සේවා ආර්ථික කටයුත්ත, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප ආර්ථික කාර්යයන් ගෙන් සමන්විත වේ. 2024 දෙවන කාර්තුවේ දී ගොඩබිම් ප්‍රවාහන කටයුතු තරමක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ දෙවන කාර්තුව ට සාපේක්ෂව, පොදු මගී ප්‍රවාහන සේවා හා භාණ්ඩ ප්‍රවාහන සේවා වල සැලකිය යුතු ධන වර්ධනයක් වාර්තා නොකිරීම මේ සඳහා බලපා ඇත. මේ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මගින් සකසනු ලබන මගී කිලෝ මීටර් ප්‍රමාණය සියයට 4.3 කින් වැඩි වී ඇති අතර ජාතික ගමනාගමන කොමිසම මගින් හා දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සකසනු ලබන මගී කිලෝ මීටර් ප්‍රමාණය පිළිවෙලින් සියයට 9.0 කින් සහ සියයට 28.0 කින් අඩු වී ඇත.තව ද මෙම කාර්තුවේ දී ගුවන් ප්‍රවාහනය ද සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර ශ්‍රී ලංකා ගුවන් සමාගමේ මගී කිලෝ මීටර් සංඛ්‍යාව සියයට 8.0 කින් අඩු වී ඇත.ගබඩා පහසුකම් සැපයීම සහ ප්‍රවාහන සහය සේවා කාර්යයන් සියයට 5.6ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මේ ආකාරයට සිදුවූ අඩු වැඩි වීම් වල සමස්ත බලපෑම වශයෙන් ප්‍රවාහන කටයුතු 2023 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 දෙවන කාර්තුවේ දී සියයට 1.8 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

තැපැල් හා කුරියර් සේවා” ආර්ථික කටයුත්ත සැලකීමේදී, 2023 දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 දෙවන කාර්තුවේ සියයට 13.3 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයට තැපැල් දෙපාර්තමේන්තුවේ මුලු වියදම් සියයට 9.6කින් අඩු වීමත්, කුරියර් කටයුතු වල ආදායම් සියයට 21කින් වැඩි වීම හේතු වී ඇත. ඒ අනුව ස්ථාවර මිල ගණන් යටතේ තැපැල් කටයුතුවල දළ එකතුකළ අගය සියයට 13.8 ක වර්ධනයක් සහ කුරියර් කටයුතුවල දළ එකතුකළ අගය සියයට 13.0 පමණ වර්ධනයක් මෙම කාර්තුවේ දි වාර්තා කර ඇත.

“නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම” යන ආර්ථික කටයුත්ත 2023 වසරේ දෙවන කාර්තුවේ වාර්තා කල සියයට 31.1 ක වර්ධනයට සාපේක්ෂව 2024 දෙවන කාර්තුවේදී දී සියයට 21.1 කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) වාර්තා අනුව 2023 දෙවන කාර්තුවේදී දී විදේශීය සංචාරකයන් 289,195 පැමිණ තිබූ අතර එය 2024 වසරේ දෙවන කාර්තුවේදී දී 374,465 ලෙස වාර්තා වී ඇත. ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 වසරේ දෙවන කාර්තුව තුළ කාර්තුමය පිරිවැටුම 2023 වසරේ දෙවන කාර්තුවේ කාර්තුමය පිරිවැටුම හා සසඳන විට සියයට 13.7කින් වැඩි වී ඇත.

“වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම” යන සේවා ආර්ථික කාර්යය සියයට 5.3 වර්ධනයක් 2024 දෙවන කාර්තුවේ වාර්තා කර ඇත. මෙම කර්මාන්තය තුළ වියදම්වල වැඩිවීමක් සහ ආදායමේ වැඩි වීමක් පසුගිය කාර්තුවට සාපේක්ෂව දක්නට ලැබුණු අතර එය එකතු කළ දළ අගයෙහි වැඩි වීමට හේතු විය.

2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී “විදුලි සංදේශ සේවා සැපයීම” උප ආර්ථික කටයුත්ත සියයට 6.7 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වර්ෂයේ දෙවන කාර්තුවේ දී එහි සියයට 3.4 පසුබැසීමක් වාර්තා වී තිබිණි. 2024 වර්ෂයේ දෙවන කාර්තුව තුලදී ස්ථාවර දුරකථන සම්බන්ධතාවන්හී සියයට 11.7 ක අඩුවීමක් සහ ජංගම දුරකථන සම්බන්ධතාවන්හී සියයට 1.1 ක අඩුවීමක් වාර්තා වී ඇති නමුත් අන්තර්ජාලය සහ විද්‍යුත් තැපැල භාවිතා කරන සම්බන්ධතාවන්හී සියයට 18.8ක වර්ධනයක් වාර්තා වී ඇත. තවද සංනිවේදන කටයුතු සඳහා දත්ත භාවිතය මෙම කාලය තුළ දී සියයට 20.8 කින් වැඩිවී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.6ක දායකත්වයක් සපයන තොරතුරු තාක්‍ෂණය (IT) සහ තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ සේවා (ITES) ඇතුළු “පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්”, 2023 දෙවන කාර්තුව හා සසඳන විට මෙම කාර්තුවේ දී සියයට 14.0 ක වැඩිවීමක් වාර්තා කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව දෙවන කාර්තුව හා සසඳන විට 2024 දෙවන කාර්තුව තුළදී එක්සත් ජනපද ඩොලරයේ අගයෙන් පරිගණක සේවා අපනයන ආදායම ඩොලර් මිලියන 181 සිට ඩොලර් මිලියන 205 දක්වා සියයට 13.1 කින් වැඩි වී ඇත.මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව 2023 දෙවන කාර්තුව හා සසඳන විට 2024 දෙවන කාර්තුවේ දී පරිගණක සේවාවලින් උපයන ලද අපනයන ආදායමේ වටිනාකම රු. මිලියන 56,180 සිට රු. මිලියන 61,676 දක්වා වැඩි වී ඇත.

මුල්‍ය සේවා සැපයීම” ආර්ථික කටයුත්ත සඳහා බලපත්‍රලත් වාණිජ බැංකු (එල්සීබී), බලපත්‍රලත් විශේෂිත බැංකු (එල්එස්බී), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව (සීඑස්ඊ) සහ ශ්‍රී ලංකාවේ ගෘහ නියෝජනය කරන පුද්ගලයින් විසින් සපයනු ලබන මූල්‍ය ආයතන විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්හි දත්ත උපයෝගී

කර ගනී. මෙම ආර්ථික කටයුත්ත 2023 වසරේ දෙවනවන කාර්තුවට සාපේක්ෂව 2024 වසරේ දෙවනවන කාර්තුවේ සියයට 5.7ක ධනාත්මක වර්ධනයක් වාර්තා වේ. මෙම කාර්තුවේදී ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) සියයට 2.2කින් පමණ වර්ධනය වී ඇත. මෙම කාර්තුවේදී ස්ථාවර මිල ගණන් යටතේ එකතුකළ අගය රුපියල් මිලියන 124,492ක් වූ අතර එය 2023 වසරේ දෙවනවන කාර්තුවේ වාර්තා වූ රුපියල් මිලියන 117,800ට වඩා ඉහළ අගයක් ගනී. මූල්‍ය සේවාවන්හි භාවිතාව, ණය හා අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව 2024 වසරේ දෙවනවන කාර්තුවේදී මූල්‍ය ආයතන වල, ණය සහ අත්තිකාරම්වල සියයට 5.5ක වර්ධනයක් ඇති අතර පොලී ආදායමේ සියයට 19.2ක පසුබැස්මක් වාර්තා කර ඇත. එමෙන්ම මෙම කාර්තුවේදී මූල්‍ය ආයතනවල, මුළු තැන්පතුවල වටිනාකම සියයට 10.4කින් වර්ධනය වී ඇති අතර පොලී වියදම් සියයට 33.3කින් අඩුවීමක් වාර්තා කර ඇත. 2024 දෙවනවන කාර්තුවේ "හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය" සහ "හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය" පිළිවෙලින් සියයට 12.5ක් සහ සියයට 8.4ක් ලෙස සටහන් විය.

"රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ" කටයුතු වල මුර්ත එකතුකළ අගය 2024 වසරේ දෙවන කාර්තුවේදී සියයට 14.1 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ දෙවන කාර්තුවේ දී සියයට 36.7 ක වර්ධනයක් වාර්තා කර ඇත. රක්ෂණ සේවාව භාවිතය මැන දක්වන උපයන ලද රක්ෂණ වාරික වටිනාකම හා උපයන ලද හිමිකම් වටිනාකමෙහි එකතුව මෙම කාර්තුවේ දී සියයට 12.2 කින් වර්ධනය වී ඇත. එමෙන්ම මෙම කාර්තුවේදී ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (NCPI) අගය සියයට 2.2 කින් වර්ධනයවී ඇත.

"දේපළ වෙළඳාම් කාර්යයන් (නිවාස අයිතිය ඇතුළත්)" 2023 දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 4.2 ක ධන වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ආර්ථික කටයුත්තේ ස්ථාවර මිළ යටතේ එකතු කළ අගය රුපියල් මිලියන 123,621 ක් වන අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය සියයට 4.0 ක් වේ.

වෘත්තීය සේවා උප ආර්ථික කටයුත්ත 2024 වසරේ දෙවන කාර්තුවේදී ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 51,990 ක් වාර්තා කර ඇති අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.7 ක පමණ දායකත්වයක් ලබාදී ඇත. මෙම ආර්ථික කටයුත්තෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් "නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහ නිර්මාණ හා ඉංජිනේරු කාර්යයන්", "විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්", "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන් සහ ප්‍රකාශන කාර්යයන්", "පශුවෛද්‍ය කාර්යයන්", "කුලී හා බදු කාර්යයන", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශන කාර්යයන්" සහ "ගොඩනැගිලි හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් කාර්යයන්" ගෙන් සමන්විත වේ. මෙම කාර්තුව තුලදී මෙම ආර්ථික කටයුතු නිමැවුම් අගය ගණනය කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන එකතුකල අගය මත පනවන බදු දත්ත වලට අනුව වේ. වෘත්තීය සේවා 2023 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 2.3 ක වර්ධනයක් වාර්තා කොට ඇත.

2024 වසරේ දෙවන කාර්තුවේදී මානව සෞඛ්‍ය සේවා අංශය සැලකිය යුතු පසුබැසීමක් වාර්තා කර ඇත. මෙම අංශයේ සෘණවර්ධන වේගය සියයට 2.3ක් ලෙස සටහන් වූ අතර, එය පෙර වසරේ එම කාලයට සාපේක්ෂව ආර්ථික ක්‍රියාකාරකම්වල හැකිලීමක් පෙන්නුම් කරයි. කොළඹ කොටස් වෙළඳපොලේ' ලියාපදිංචි කර ඇති දිවයිනේ ප්‍රධාන රෝහල් හයක ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනයන්ගේ දෙවන කාර්තුවේ (අප්‍රේල් සිට ජුනි දක්වා) දත්ත අනුව, එම රෝහල්වල කාර්තුමය පිරිවැටුම 2023 වසරේ දෙවන කාර්තුවේ මූල්‍ය ප්‍රකාශන (අප්‍රේල් සිට ජුනි දක්වා) දත්ත හා සසඳන විට සියයට 3.2 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම, මෙම කාර්තුව තුළදී ඊ චැනලින් සේවාවන් සියයට 6.3 අඩු වීමක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුව තුළ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සෞඛ්‍ය උප දර්ශකයට අනුව එහි දර්ශක අගය 191.6 සිට 195.0 දක්වා සියයට 1.8කින් ඉහළ ගොස් ඇත. එය 2023 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2024 වසරේ දෙවන කාර්තුවෙහි සෞඛ්‍ය අංශයේ මිල මට්ටම්වල යම් වැඩිවීමක් පෙන්නුම් කරයි

වර්තන මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයට සියයට 4.8 ක දායකත්වයක් සපයන "අනෙකුත් පුද්ගලික සේවා ක්‍රියාකාරකම්"යන ආර්ථික කටයුත්ත "කලා සහ පොදු විනෝදාස්වාදය", "වෙනත් පුද්ගලික ක්‍රියාකාරකම්" සහ "සේවායෝජකයන් ලෙස ඇති ගෘහ ඒකක වල කටයුතු" යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. 2023 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දි වාර්තා වී ඇත්තේ සියයට 0.6 ක වර්ධනයකි. තවදුරටත් අමුද්‍රව්‍ය මිල අඩුවීම සහ මෙම සේවාවන් ලබාගන්නා පාරිභෝගිකයින් සංඛ්‍යාව ඉහල යාම මෙම වර්ධනයට හේතු වී ඇත.

| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර |
|---|---|
| දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම | ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශිලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාන මන්දිරය
අංක.306/71,පොල්දූව පාර
බත්තරමුල්ල

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

දෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
National.accounts@statistics.gov.lk
+9411 2147071 +94 112877938